# ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 ජනවාරි 01 කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන විධාන 2021 අංක 01**

## නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය සංශෝධනය කිරීම

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල අනුව ශ්‍රී ලංකාවේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 04 දරන නිශ්චල දේපල තක්සේරු කිරීම විධානය සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් පහත සඳහන් සංශෝධන නිකුත් කරනු ලැබේ.

ඒ අනුව, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 04 දරන නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානයේ අංක 5 සහ 7 විධානයන් පහත සඳහන් විධාන මඟින් ප්‍රතිස්ථාපනය වේ.

5. තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය සඳහා නිර්ණායකයන්

5.1 සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක්ම පහත සඳහන් දෑ තහවුරු කළ යුතුය.

අ. තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායක පහත පරිදි වේ.

අ.1 **ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ සංගමයේ (අයි වී එස් එල්) සාමාජිකයෙකු විය යුතු අතර, ඔහු**

i. සම සාමාජිකයෙකු හෝ

ii. අදාළ සාමාජිකත්ව ශ්‍රේණියේ වසර 5 ක පළපුරුද්දක් සහිත වෘත්තීය ආශ්‍රිත සාමාජිකයෙකු විය යුතුය.

වෘත්තීය ආශ්‍රිත සාමාජිකත්ව ශ්‍රේණියේ පළපුරුද්ද සහිත වසර ගණන නිර්ණය කිරීම සඳහා 2019 අංක 09 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන සංශෝධන පනතේ 24 වන වගන්තියේ දක්වා ඇති අන්තර්කාලීන විධිවිධාන අදාළ වේ.

අ.2 **එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ (ආර් අයි සී එස්) වරලත් තක්සේරුකරණ මිනින්දෝරුවෙක් විය යුතු අතර ඔහු,**

i. ආර් අයි සී එස් හි සම සාමාජිකයෙකු හෝ,

ii. එවැනි සාමාජිකත්ව ශ්‍රේණියේ වසර 05 ක පළපුරුද්දක් ඇති ආර් අයි සී එස් හි අනෙකුත් සාමාජිකයෙකු විය යුතුය.

ආ. ඉහත 5.1 (අ) විධානයෙහි දක්වා ඇති සුදුසුකම් අනුව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල තක්සේරුකරුවන්ගේ මණ්ඩලය සඳහා තෝරාගත් තක්සේරුකරුවන් අදාළ වෘත්තීය ආයතනය විසින් අනුමත කරන ලද/නිර්දේශිත පරිදි අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයන් ලබා ගත යුතුය.

ඇ. නිශ්චල දේපල තක්සේරු කිරීම සිදු කරනු ලබන අභ්‍යන්තර තක්සේරුකරුවන් විසින් ඉහත 5.1 (අ) විධානයෙහි දක්වා ඇති සුදුසුකම් නිර්ණායක සපුරාලිය යුතුය.

ඈ. නිශ්චල දේපල තක්සේරු කිරීමේදී ඉහළම මට්ටමේ වෘත්තීය හැසිරීම, ආචාර ධර්ම සහ අඛණ්ඩතාව පවත්වා ගෙන යන තක්සේරුකරුවන් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල තක්සේරුකරුවන්ගේ මණ්ඩලයට ඇතුළත් කළ යුතුය.

**7.තක්සේරු කිරීමේ වාර ගණන**

7.1 නිශ්චල දේපල තක්සේරු කිරීමේ වාර ගණන පහත පරිදි විය යුතුය.

අ. යම් නියාමන අරමුණක් සඳහා අක්‍රීය ලෙස වර්ගීකරණය කර ඇති ණය සහ අත්තිකාරම් වලට එරෙහිව සුරැකුම් ලෙස ලබාගෙන ඇති නිශ්චල දේපල තක්සේරු කිරීමේ වාර ගණන පහතින් දක්වා ඇත.

i. ණය ගැනුම්කරු විසින් තම නේවාසික අරමුණ සඳහා නේවාසික දේපලක් සඳහා ණය පහසුකම් ලබා ගන්නේ නම්, තක්සේරු වාර්තාව වසර පහකට නොවැඩි විය යුතුය.

ii. අනෙකුත් සියලුම ණය පහසුකම් සඳහා තක්සේරු වාර්තාව වසර හතරකට නොවැඩි විය යුතුය.

ආ. සක්‍රීය ණය සහ අත්තිකාරම් වලට එරෙහිව සුරැකුමක් ලෙස ලබාගෙන ඇති නිශ්චල දේපලෙ හි තක්සේරු වාර්තාව ණය අත්තිකාරම් ලබා දෙන අවස්ථාවේ සහ ණය පහසුකම ක්‍රමයෙන් වැඩි කරන අවස්ථාවන්හිදී ලබා ගත යුතුය.

ඇ. කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 04 දරන නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානයේ විධාන 4.1 ආ සහ ඇ විධානයන්හි සඳහන් පරිදි නිශ්චල දේපල ප්‍රත්‍යාගණනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූලව හෝ එවැනි නිශ්චල දේපලවල වටිනාකමෙහි සැලකිය යුතු වෙනස්කම් මත පදනම්ව සිදු කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි ප්‍රතිලාභ දෙවන පෙළ ප්‍රාග්ධනයට අන්තර්ගත කළ හැකි වන්නේ වසර තුනකට වරක් පමණි.

**පෙර විධානයන් අවලංගු කිරීම**

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2019 අංක 02 දරන නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය සඳහා සංශෝධන විධානය මෙයින් අවලංගු කරන ලදී.


**ජේ ඩී එස් ජේ නානායක්කාර**

අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව,

ශ්‍රී ලංකා මහ බැංකුව